(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 46.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2010 නොවැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0042/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයට අයත් විශ්වවිද්‍යාල සංඛ්‍යාව කවරේද;

(ii) එම එක් එක් විශ්වවිද්‍යාලය පිහිටා ඇති ස්ථානය සහ එම ස්ථානය අයත් වන පළාත, දිස්ත්‍රික්කය සහ මැතිවරණ කොට්ඨාසය කවරේද;

(iii) ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික විශ්වවිද්‍යාල ක්‍රියාත්මක වන්නේද;

(iv) එසේ නම්, ඒවායේ නම් සහ එම එක් එක් විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(v) එම විශ්වවිද්‍යාල මඟින් දේශීය උපාධි පිරිනමනු ලබන්නේද; නැතහොත් විදේශීය උපාධි පිරිනමනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ හයක කාලය තුළ එක් එක් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු පවත්වනු ලැබූ දින සංඛ්‍යාව කවරේද;

(ii) පසුගිය වර්ෂ හයක කාලය තුළ කිසිදු පංති වර්ජනයකින් තොරව විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කටයුතු පවත්වනු ලැබුවේ නම්, එලෙස අධ්‍යයන කටයුතු පැවැත්වීමට ඉඩ තිබූ දින ගණන හා ඉහත (i) හි සඳහන් දින ගණන අතර සංසන්දනය කවරේද;

(iii) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය ශිෂ්‍ය පැමිණීම වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා එක් එක් පීඨය අනුව සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බරපතළ ලෙස නවක වධය දීම පිළිබඳව වාර්තා වී ඇති විශ්වවිද්‍යාල සංඛ්‍යාව කවරේද;

(ii) පසුගිය වර්ෂ 2 තුළ ඒ සම්බන්ධයෙන් අධිකරණයේ විභාග කර අවසන් වූ සහ ඉදිරියේ දී විභාගවීමට නියමිතව ඇති නඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0053/'10

2.

ගරු රාජීව විජේසිංහ මහතා,—මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) රාජ්‍ය නොවන සංවිධානවලට සහ පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කර ඇති සමාජ සේවා කටයුතුවල යෙදෙන ආයතනවලට ලැබෙන විදේශ අරමුදල් අධීක්ෂණය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් කවරේද;

(ii) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වී ඇති සමාජ සේවා හෝ පර්යේෂණ හෝ උපදේශන කටයුතුවල යෙදෙන සමාගම්වලට ලැබෙන විදේශ මුදල් අධීක්ෂණය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් කවරේද;

(iii) මෙම සමාගම් නීතියෙන් නියමකර ඇති පරිදි තම ලැබීම් ඉදිරිපත් කරන්නේද, බදු ලිපිගොනු පවත්වාගෙන යන්නේ ද සහ මෙවන් සමාගම්වලට ලැබී තිබිය හැකි ප්‍රදානයන් සහ මෙවන් සමාගම්වලට ලැබී තිබිය හැකි ප්‍රදානයන් මත බදු ගෙවීම් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1999 සහ 2010 අතර වර්ෂ 2010 ඇතුළත් කාලසීමාව තුළ ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට බාහිර මූලාශ්‍රවලින් ලැබුණ අරමුදල් සහ එම අරමුදල් භාවිතා කළ කාරණා කවරේද;

(ii) මෙම අරමුදල් ලබාගත් හේතු විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කළේද;

(iii) මෙම අරමුදල් භාවිතා කිරීම ආණ්ඩුවේ කිසියම් නියෝජිතායතනයක් මගින් අධීක්ෂණය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0081/'10

3.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොලපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වකමුල්ල ග්‍රාම නිලධාරී වසමේ, තොරණ හංදියේ සිට ජල සම්පාදන මණ්ඩලය දක්වා මාර්ගයේ මීටර් 200 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ගැලවී, වලවල් සෑදී, අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්ත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0294/10

4.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 1991.08.25 දින ලංගම ජනතාකරණය කිරීමෙන් පසු 2002 වර්ෂය දක්වා විශ්‍රාම ගිය සේවකයන්ට මුල් පත්වීමේ දින සිට පාරිතෝෂික ගෙවීමට ශ්‍රී ලංගමය බැඳී සිටින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මුල් පත්වීමේ දින සිට ඔවුන්ට පාරිතෝෂික ගෙවීමට නොහැකි බවට ශ්‍රී ලංගමය අධිකරණ තීන්දුවක් ඉල්ලා සිටියේද;

(ii) එම අධිකරණ තීන්දුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) කම්කරු කොමසාරිස්වරයා විසින් එම විශ්‍රාමිකයන්ට පාරිතෝෂික ගෙවන ලෙස උපදෙස් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ විශ්‍රාමික සේවකයින් කී දෙනෙකු සඳහාද;

(iii) ගෙවීමට ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම විශ්‍රාමිකයන්ට පාරිතෝෂික ගෙවීමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) එම මුදල් කඩිනමින් ගෙවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0342/'10

5.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජී. එස්. පී. ප්ලස් සහනය යටතේ අප රටින් අපනයනය කරන නිෂ්පාදන වර්ගයන් කවරේද;

(ii) එම නිෂ්පාදන අපනයනය කරන රටවල් කවරේද;

(iii) නිෂ්පාදන යැවීමේදී ලබා දුන් බදු සහනය කොපමණද;

(iv) මෙම සහනය ඉවත් කළහොත් අහිමි වන රැකියා සංඛ්‍යාව කොපමණද;

(v) මෙම සහනය ඉවත් කිරීමෙන් බලපෑමක් ඇතිවන ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජය විදේශ විනිමය උපයා ගැනීම සඳහා ගන්නා පියවර කවරේද;

(ii) ජී. එස්. පී. ප්ලස් නොදුන් යුරෝපා රටවලට නිෂ්පාදන යැවීමේ දී සිදු වන පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0531/'10

6.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, අක්කරපත්තු - මඩකලපුව - තිරික්කොන්ඩියාඩුමඩු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබාගත්තේද;

(ii) නොඑසේ නම් විදේශ ආධාර මගින් ලබාගත්තේද;

(iii) විදේශ ආධාර ලබාගත්තේ නම් ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0566/'10

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සමූපකාර පනත යටතේ මහ බැංකුව විසින් ලියාපදිංචි කරන ලද සීමාසහිත ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධන බැංකු සමිතිය මේ වනවිට සියලුම ශාඛාවන් ඇවර කර, වසා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම බැංකුව සතුව පැවති ශාඛාවන් ප්‍රමාණය කොපමණද;

(ii) තැන්පත්කරුවන් සංඛ්‍යාව සහ තැන්පත් කර තිබූ මුළු තැන්පතු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) තැන්පතු ආපසු ගෙවීම සඳහා 2007 වර්ෂයේදී අතුරු කමිටුවක් පත් කළේද;

(ii) එසේ නම්, එම අතුරු කමිටුවේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත බැංකුවේ තැන්පත්කරුවන්ට ආපසු ගෙවිය යුතු මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් නැවත ගෙවීමට කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, එම මුදල් ගෙවා අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0573/'10

8.

ගරු රවුෆ් හකීම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 දෙසැම්බර් 26 වැනි දින සිදුවූ සුනාමි ව්‍යසනයෙන්, දෙමව්පියන් මිය යෑමෙන් හෝ අතුරුදහන්වීමෙන් අනාථයන් බවට පත්වූ දරුවන්ගෙන් රජයේ සහ පෞද්ගලික ළමා නිවාසවලට ඇතුළත් කරනු ලැබූ දරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එවකට එම දරුවන්ගේ වයස සහ ඔවුන්ගේ නම් හෝ පසුව ළමා නිවාස මගින් ඔවුන් හඳුනාගැනීම පිණිස තබන ලද නම් කවරේද;

(iii) එම එක් එක් දරුවා රජයේ පරිවාස භාරයට ලබාදීමට සහාය වූ පොලිස් ස්ථාන, රෝහල් හෝ පුද්ගලයන් කවරේද;

(iv) මේ වන විට එම දරුවන් රඳවා සිටින රජයේ සහ පෞද්ගලික ළමා නිවාසයන්හි නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම දරුවන් අතරින්, මේ වන විට, දෙමව්පියන් හෝ භාරකරුවන් හඳුනාගෙන ඔවුන්ගේ භාරකත්වයට පත්කර ඇති දරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, එම පවරා දෙන ලද දිනය, ඉදිරිපත්වූ දෙමව්පියන් හෝ භාරකරුවන්ගේ නම්, ලිපිනයන් සහ එම පැවරීම සිදු කරන ලද අධිකරණය කවරේද;

යන්න දිස්ත්‍රික් මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0047/'10

9.

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලෝක වෙළඳපොළෙහි තෙල් බැරලයක මිල පහත වැටී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 ජනවාරි සිට මේ දක්වා වූ කාල පරිච්ඡේදය තුළ තෙල් බැරලයක මිල උච්ඡාවචනය වී ඇති ආකාරය කෙබඳුද;

(ii) මෙරටට පැමිණෙන විදේශීය නැව්වලට අලෙවි කරන ඩීසල් ලීටරයක විකුණුම් මිල සහ දේශීය පාරිභෝගිකයින්ට අලෙවි කරන ඩීසල් ලීටරයක විකුණුම් මිල කවරේද;

(iii) ගුවන් යානාවන්හි භාවිතය සඳහා අලෙවි කරන ඉන්ධනවල මිල කවරේද;

(iv) දේශීය ධීවර යාත්‍රා සඳහා අලෙවි කරන ඩීසල් ලීටරයක මිල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) විදේශීය නැව්වලට අලෙවිකරන ඉන්ධන සඳහා ලබාදෙන සහනය දේශීය ධීවර යාත්‍රාවලට ලබා නොදීමට හේතු කවරේදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0335/'10

10.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සූරියවැව, නඹඩගස්වැව, ප්‍රියශානි ලිපිනයේ පදිංචි එස්. ජී. කුසුමාවතී මහත්මියට ලබා දුන් නඹඩගස්වැව, මහආර යූඩී 06, අංක 7 වාරි ඉඩම මෙතෙක් නිරවුල් කර දී නොමැති බවත්;

(ii) ඇයගේ ස්වාමිපුරුෂයා වල් අලියකුගේ පහර දීමෙන් මිය ගොස් ඇති අතර ඇය විසින් අති දුෂ්කරතා මධ්‍යයේ දරුවන් 4 දෙනෙකු පෝෂණය කරන බවත්;

(iii) කුසුමාවතී මහත්මියගේ අංක 7 ඉඩම අනවසරයෙන් වෙනත් අයකු විසින් අල්ලාගෙන ඇති අතර, මීට අමතරව ඔහු විසින් යූඩී. 08 වූ තවත් ඉඩමක්ද අල්ලාගෙන ඇති බවත්;

(iv) මෙම ඉඩම නිරවුල් කර ගැනීම සඳහා කුසුමාවතී මහත්මිය මයුරපුර ඉඩම් කාර්යාලයට ගොස් තම ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත්;

(v) ඒ සම්බන්ධයෙන් මෙතෙක් නිලධාරීන් අවධානය යොමුකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) කුසුමාවතී මහත්මියට ලැබී ඇති අංක 7 ඉඩමේ නිරවුල් භුක්තිය ඇයට ලබාදීමට කටයුතු කරන්නෙහිද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා වෙනත් ඉඩමක් ඇයට ලබාදෙන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0532/’10

11.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, අම්බිලන්තුරෙයි - වීරමුනායි මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0048/’10

12\.

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිමකරන දිනය කවරේද;

(ii) ව්‍යාපෘතිය ආරම්භයේදී ඇස්තමේන්තුගත පිරිවැය සහ මේ වන විට පිරිවැය වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබාදීමට ඉඩ ඇති රට හෝ ආයතනයේ නම කවරේද;

(iv) ණය ලබාදීමේ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මුදලේ අගය ක්ෂයවීම ද ඇතුළත්ව විදුලි ඒකකයක පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0336/’10

13\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, ලුණුගම්වෙහෙර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන එම්. ආර්. තාසිම් මුස්ලිම් විද්‍යාලයේ අනුමත ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම විද්‍යාලයේ ගුරු ඌණතාවයන් පවතින විෂයයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉංග්‍රීසි විෂයය සඳහා 2006 වර්ෂයේ සිට ගුරු පුරප්පාඩු පවතින බවත්;

(ii) එම විෂයය සඳහා ස්වේච්ඡාවෙන් ඉගැන්වීමට හම්බන්තොට මේ වීදිය ලිපිනයේ පදිංචි තුවාන් සල්ෆිකාර් අලි මහතා කටයුතු කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඔහුගේ සේවය නැවත මෙම විද්‍යාලයට ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන්නේද;

(ii) එසේ නම්, ඒ කවදා සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0533/’10

14\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, සියඹලාණ්ඩුව - අම්පාර - කාරතිව් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල් වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— 2010 නොවැම්බර් මස 23 වැනි අඟහරුවාදා, 24 වැනි බදාදා, 25 වැනි බ්‍රහස්පතින්දා, 26 වැනි සිකුරාදා, 27 වැනි සෙනසුරාදා සහ 29 වැනි සඳුදා යන දිනයන් 'විසර්ජන පනත් කෙටුම්පත (2011)' සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන්ව තිබුණද, 'විසර්ජන පනත් කෙටුම්පත (2011)' සලකා බැලීම සඳහා 2010 නොවැම්බර් මස 23 වැනි දින සිට නොවැම්බර් මස 27 වැනි දින දක්වා ඇති වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 7.00 දක්වා විය යුතු ය. අ. භා. 6.30 ට ස්ථාවර නියෝග අංක 7හි (5) සහ (6) ඡේදයන් ක්‍රියාත්මක විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන්ව තිබුණද, 'විසර්ජන පනත් කෙටුම්පත (2011)' සලකා බැලීම සඳහා 2010 නොවැම්බර් මස 29 වැනි සඳුදා දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 6.00 දක්වා විය යුතුය. අ. භා. 6.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සමනලගිරි සතරාංග (නාඩි) වෛද්‍ය සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමග කියවිය යුතු 26 වැනි වගන්තිය යටතේ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2010 ජූලි මස 12 දිනැති අංක 1662/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 ජූනි මස 17 දිනැති අංක 1658/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 අගෝස්තු මස 09 දිනැති අංක 1666/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 සැප්තැම්බර් මස 09 දිනැති අංක 1670/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2010 අගෝස්තු මස 30 දිනැති අංක 1669/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*6.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2010 ජූලි මස 09 දිනැති අංක 1661/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*7

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 240— වැඩසටහන 2,—† 2010 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන 2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් දැනටමත් අනුමතකර ඇති වියදම් සීමා නොඉක්මවන පරිදි, එහි විවිධ වැය ශීර්ෂ යටතේ අපේක්ෂිත ඉතිරිවීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂයේ "අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතියට" මාරුකර ගැනීමටත්, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 6(1) හා 6(2) වැනි වගන්ති මගින් සලසා ඇති විධිවිධානවලට යටත්ව හඳුනාගත් විදේශ මූල්‍යකරණ සහිතව ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙමින් පරිපූරක ප්‍රතිපාදන ලෙස අදාළ අමාත්‍යාංශවලට මාරු කිරීමට හැකිවන පරිදි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයට අයත් අනෙකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව විසින් මූල්‍යකරණය කරන ලද රුපියල් බිලියන පහළොවක් (රු: 15,000,000,000) නොඉක්මවන මුදලක් උප ලේඛනයේ දක්වා ඇති ආකාරයට සලසා ගතයුතු බවට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා යෝජනා කරයි.

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 240 - | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන | 2 - | සංවර්ධන වැඩසටහන | | |
| | | පුනරාවර්තන වියදම් | රු. | 3,000,000,000 |
| | | මූලධන වියදම් | රු. | 12,000,000,000 |
| | | මුළු වියදම | රු. | 15,000,000,000 |

(රුපියල් බිලියන පහළොවක් පමණි.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2010 නොවැම්බර් මස 09 වැනි දින ඉදිරිපත් කරන ලද 2010 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*8.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*9.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*10.

විසර්ජන පනත් කෙටුම්පත (2011) — දෙවැනි වර කියවීම

*11.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*12.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*13.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 41 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සභා (වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර)" නියෝගයේ 3 වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2009 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1633 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*14.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*15.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*16.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*17.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*18.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*19.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*20.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*21.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

22.

තාරුණ්‍යයට හෙටක් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත—දෙවැනි වර කියවීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**